# 8 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 22 - සයුරු ගැබෙන් මතු වූ නැව



## නිපුණතාව 10.0 :

සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

## නිපුණතා මට්ටම 10.2 :

විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යය සඳහා යොදා ගනියි.

## ක්‍රියාකාරකම් (01) :

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා ලියන්න.**

1. පුරාවිද්‍යාඥයින්ගේ මතය අනුව මෙම නැව ගිලී ගොස් තිබුණේ කිනම් රාජධානී සමයේ ද?
2. මෙම පෞරාණික වස්තුවල පෞරාණික බව මනින පර්යේෂණ ක්‍රමය කුමක් ද?
3. සොයා ගත් ඉපැරණි ගල් ආසනයේ තිබූ සලකුණු මොනවා ද?
4. පුරාවිද්‍යාඥයින් පවසන පරිදි මෙවැනි ගල් ආසන අතීතයේ දී පරිහරණය කර ඇත්තේ කවුරුන් විසින් ද?
5. ගල් ආසනය සමඟ හමු වූ වෙනත් දේවල් මොනවා ද?

නන්දිපාද ලකුණ හා ත්‍රිශූලයක් / මැටි බඳුන් හා වෙනත් අවශේෂ / අනුරාධපුර රාජධානි සමයේ මුල් යුගයේ දී / කාබන් 14 කාල නිර්ණය ක්‍රමය/ බෞද්ධ භික්ෂූන් වහන්සේලා

## ක්‍රියාකාරකම් (02) :

**පහත සඳහන් වචනවලට සමාන පද පාඩමෙන් තෝරා ලියන්න.**

සාගරය =

ලී =

අසුන =

ළඟ =

නෞකාවෙන් =

කාලයේ =



## ක්‍රියාකාරකම් (03) :

### නිවැරදි අක්ෂර වින්‍යාසය යොදන්න.

එහි තිබී වි..... ල (ශා/ෂා/සා) බර..... (ණි/නි) තොගයක් හමුවි ය. මැටි බ....න් (ඳු/දු) සහ වෙනත් අව.... ..... (ශේෂ/ශේෂ/සේශ) කොටස් හමුවි ය. ඉදිරි ගවේ..... ...... (ෂණ/ශන/සන) හා සංරක්...... ...... (ශන/ෂණ/සන) කටයුතු යළි ආරම්..... (බ/භ) කර..... (ණු/නු) ඇත. වැදගත් තොරතුරු රැසක් අනාවර......ය (ණ/න) කර ගත හැකිවේය යන්න පුරාවිද්‍යා.......යන්ගේ (ඥ/ඤ) අපේක්.....ව යි. (ෂා/සා/ශා)



## නිපුණතාව 5.0 :

**භාෂාත්මක කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.**

## නිපුණතා මට්ටම 10.2 :

**වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.**

# ක්‍රියාකාරකම් (04) :

## පහත සඳහන් තනි පද යා කරන්න.

| | |
|---|---|
| 1. පරාජය කරන්නට නොහැකි | අසමසම |
| 2. රජ පවුලට අයත් වූ | අස්වැන්න |
| 3. යම් වගාවක පලදාව | අපරාජිත |
| 4. පැරණි යුගයෙහි පැවති | රාජකීය |
| 5. සමාන කරන්නට කිසිවෙකුත් නැති | චිරන්තන |



## නිපුණතාව 8.0 :

භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

## නිපුණතා මට්ටම 8.1 :

වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

# ක්‍රියාකාරකම් (05) :

## පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.

1. රචනා ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අතුරින් තුනක් ලියන්න.
2. රචනා ලිවීමට පෙර ඔබේ පහසුව සඳහා නිර්මාණය කරගත යුත්තේ කුමක් ද?
3. රචනා සැකිල්ලක් ප්‍රධාන වශයෙන් වර්ග කරන කොටස් තුන නම් කරන්න.
4. ' ජල සම්පත සුරකිමු ' යන මාතෘකාව යටතේ රචනා සැකිල්ලක් සකසන්න.
5. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 (දෙසීයක) පමණ රචනාවක් ලියන්න.
   - ☞ අතීත උරුමයන් රැකගනිමු
   - ☞ පොත් කියවමු දැනුම වඩමු
   - ☞ ජලය අපේ ජීවයයි
6. රචනා ලිවීම සාර්ථක කරගැනීම සඳහා අධ්‍යාපනය, සෞඛ්‍යය, සංස්කෘතිය, විද්‍යාව හා තොරතුරු තාක්ෂණය සහ ස්වභාව සෞන්දර්යය ආදී ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු රැස්කරන්න.

# පිළිතුරු

## ක්‍රියාකාරකම් (01) :

1. අනුරාධපුර රාජධානී සමයේ මුල් යුගයේ දී
2. කාබන් 14 කාල නිර්ණය ක්‍රමය
3. නන්දිපාද ලකුණ හා ත්‍රිශූලයක්
4. බෞද්ධ භික්ෂුන් වහන්සේලා
5. මැටි බඳුන් හා වෙනත් අවශේෂ

## ක්‍රියාකාරකම් (02) :

| | | |
|---|---|---|
| සාගරය | = | සයුර |
| ලී | = | දැව |
| අසුන | = | ආසනය |
| ළඟ | = | ආසන්නයේ |
| නෞකාවෙන් | = | නැවෙන් |
| කාලයේ | = | සමයේ |

## ක්‍රියාකාරකම් (03) :

එහි තිබී වි...ශා.. ල (ශා/ෂා/සා) බර..ණි. (ණි/නි) තොගයක් හමුවි ය. මැටි බ..ඳු..න් (ඳු/දු) සහ වෙනත් අව..ශේ.. .ෂ.... (ෂේශ/ශේෂ/සේශ) කොටස් හමුවි ය. ඉදිරි ගවේ..ෂ... ..ණ.... (ෂණ/ශන/සන) හා සංරක්..ෂ.... ..ණ.... (ශන/ෂණ/සන) කටයුතු යළි ආරම්..භ... (බ/භ) කරි..නු.. (ණු/නු) ඇත. වැදගත් තොරතුරු රැසක් අනාවර...ණ...ය (ණ/න) කර ගත හැකිවේය යන්න පුරාවිද්‍යා...ඥ..යන්ගේ (ඥ/ඤ) අපේක්...ෂා..ව යි. (ෂ/සා/ශා)

## ක්‍රියාකාරකම් (04) :

| | |
|---|---|
| 1. පරාජය කරන්නට නොහැකි | අපරාජිත |
| 2. රජ පවුලට අයත් වූ | රාජකීය |
| 3. යම් වගාවක පලදාව | අස්වැන්න |
| 4. පැරණි යුගයෙහි පැවති | චිරන්තන |
| 5. සමාන කරන්නට කිසිවෙකුත් නැති | අසමසම |

## ක්‍රියාකාරකම් (05) :

1. මාතෘකාවක් යෙදීම / නිවැරදි වාක්‍ය රීති අනුගමනය කිරීම/නිවැරදි අක්ෂර වින්‍යාසය/ පද බෙදීම/නිවැරදිව විරාම ලක්ෂණ යෙදීම/පැහැදිලි අත් අකුරු යෙදීම/සරලව ඉදිරිපත් කළ යුතු ය/නිරවුල් ව හා පැහැදිලිව ඉදිරිපත් කළ යුතු ය/ රසවත් මෙන්ම ප්‍රාණවත් බවින් යුතු වීම/තර්කානුකූල වීම/විචිත්‍රවත් බවක් තිබීම

2. රචනා සැකිල්ල

3. රචනා ප්‍රවේශය
   අන්තර්ගතය
   අවසානය

4. මාතෘකාව ලිවීම(ජල සම්පත සුරකිමු)
   ජලයේ වැදගත්කම (මාතෘකාව හැඳින්වීම)
   ජලයෙන් ලැබෙන ප්‍රයෝජන
   ජල සම්පත අපතේ යාම
   ජල සම්පත ආරක්ෂා කිරීම
   ජලය රැක ගැනීමට අතීත රජවරුන් කරන ලද මෙහෙවර
   ජලය රැකගැනීමට ඔබ විසින් කරන ලද යෝජනා
   රචනාවේ සාරාංශය (රචනාව අවසාන කිරීම)

# රචනා මාතෘකාව

-----------------------------------------------

-----------------------------------------------

-----------------------රචනා ප්‍රවේශය-----------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------රචනාවේ අන්තර්ගතය-----------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------රචනාවේ අවසානය-----------------------

-----------------------------------------------

-----------------------------------------------

-----------------------------------------------